- **2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා 2025 අංක 23 දරන විසර්ජන පනතේ ශීර්ෂය 224 - වැඩසටහන 01 යටතේ පරිපූරක මුදල**

සම්බන්ධයෙන්

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ

කාරක සභාවේ සභාපති

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසිනි

2026 නොවැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා

- **2026 சனவரி 01 ஆம் திகதியில் தொடங்கி 2026 திசெம்பர் 31 ஆம் திகதியில் நிறைவடைகின்ற நிதியாண்டின் பயன்பாட்டிற்காக, 2025 ஆம் ஆண்டின் 23 ஆம் இலக்க ஒதுக்கீட்டுச் சட்டத்தின் செலவினத் தலைப்பு 224 - நிகழ்ச்சித்திட்டம் 01 ன் கீழான குறைநிரப்புத் தொகை**

தொடர்பிலான

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

குழுவின் தவிசாளர்

கௌரவ (கலாநிதி) ஹர்ஷ த சில்வா அவர்களினால்

2026 நவம்பர் மாதம் 05 ஆம் திகதி வியாழக்கிழமை

பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது

Report of the Committee on Public Finance

on

- **Supplementary Sum under Head 224 of Programme 01 of the Appropriation Act No. 23 of 2025 for the services of the financial year commencing on 01st January, 2026, and ending on 31st December, 2026**

Presented to Parliament

by

Hon. (Dr.) Harsha de Silva

Chair of the Committee

Thursday, the 05th November 2026

කාරක සභා වාර්තාව

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව 2026 නොවැම්බර් මස 05 වැනි දින පැවැත් වූ එහි රැස්වීමේ දී පහත සඳහන් පරිපූරක මුදල සලකා බලන ලදී:

- **2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා 2025 අංක 23 දරන විසර්ජන පනතේ ශීර්ෂය 224 - වැඩසටහන 01 යටතේ පරිපූරක මුදල**

(2026 නොවැම්බර් 03 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව කාරක සභාවට යොමු කරන ලද)

කාරක සභාව විසින් සලකා බැලූ දිනය: **2026** නොවැම්බර් **මස 05** **වේලාව : පෙ.ව.** 08.00

<u>පැමිණි රජයේ මුදල් පිළිබඳ කාරක සභා සභිකයන්</u>

1. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.,
2. ගරු චතුරංග අබේසිංහ මහතා, පා.ම.,
3. ගරු රවී කරුණානායක මහතා, පා.ම.,
4. ගරු අජිත් අගලකඩ මහතා, පා.ම.,
5. ගරු නිමල් පලිහේන මහතා, පා.ම.,
6. ගරු විජේසිරි බස්නායක මහතා, පා.ම.,
7. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
8. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
9. ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,

- **2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා 2025 අංක 23 දරන විසර්ජන පනතේ ශීර්ෂය 224 - වැඩසටහන 01 යටතේ පරිපූරක මුදල**

<u>හැඳින්වීම</u>

වෙනස් වන මෙහෙයුම් පරිසරය, බෙංගාල බොක්ක සහ ඒ අවට ඇති ආපදාවන්ට ගොදුරු විය හැකි නිරන්තර අහිතකර කාලගුණික තත්වයන්ගෙන් පැන නගින ආසන්න තර්ජන පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නියමුවන් රහිත ගුවන් යානා පද්ධතියක් ස්ථාපිත කිරීමටත්, ලබා දී ඇති වාසිදායක වාණිජමය කොන්දේසි සැලකිල්ලට ගනිමින් එය සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස ඊශ්‍රායල රජයට අයත්, ඊශ්‍රායල එරෝස්පේස් ඉන්ඩස්ට්‍රීස් - (Israel Aerospace Industries (IAI)) සමාගම මඟින් මිලදී ගැනීමටත්, ඒ සඳහා ප්‍රාථමික වැය සීමාවට බලපෑමක් නොවන පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 224-1-01-2002 වැය විෂයෙන් රු.මිලියන 7,000 ක ප්‍රතිපාදනයක් අවුරා තබා 224-1-01-2101 වැය විෂය වෙත රු, මිලියන 4,261ක ප්‍රතිපාදනයක් පරිපූරක ඇස්තමේන්තුව මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මෙහෙයුම් වැඩසටහන යටතේ සාමාන්‍ය පරිපාලන හා ආයතනික සේවා ව්‍යාපෘතිය යටතේ සලසා ගැනීමට හැකි වන පරිදි පාර්ලිමේන්තුව වෙත යෝජනාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමටත් කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.

ඒ අනුව පාර්ලිමේන්තුවෙන් උක්ත අනුමැතිය ලබා ගැනීමට මෙම යෝජනාවෙන් අපේක්ෂා කෙරේ.

<u>කාරක සභාවේ නිරීක්ෂණ</u>

- මුදල් රෙගුලාසි 66 අනුව ප්‍රතිපාදන වැය ශීර්ෂ දෙකක් අතර, එනම් ප්‍රතිසංස්කරණය සඳහා වන ප්‍රාග්ධන ව්‍යයම්වලින් අත්පත් කර ගැනීම් සඳහා වන ප්‍රාග්ධන ව්‍යයම් වෙත ප්‍රතිපාදන මාරු කිරීමට අවසර නොමැති බැවින්, ඒ සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරන බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

- මෙවැනි සාපේක්ෂව සුළු ප්‍රමාණයේ ප්‍රතිපාදන නැවත වෙන් කිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශය පාර්ලිමේන්තුව වෙත පැමිණීම අත්‍යවශ්‍ය ද යන්න පිළිබඳව සභාපතිවරයා විසින් ප්‍රශ්න කරන ලදී.

- ඒ අනුව, අමාත්‍යාංශවල අයවැය ප්‍රතිපාදන තුළ පවතින පුනරාවර්තන (මෙහෙයුම්) ව්‍යයම් සහ ප්‍රාග්ධන ව්‍යයම් වැය විෂයයන් අතර, නිශ්චිත සීමාවක් දක්වා ප්‍රතිපාදන මාරු කිරීමට අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ සහ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත, පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව අවසර ලබා දීමේ හැකියාව පිළිබඳව කාරක සභාව යෝජනා කරන ලදී.

- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව 1996 වර්ෂයේ සිට නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් හැකියාවක් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී. එම පැරණි පද්ධතියට ගුවන් යානා දෙකක් ඇතුළත් වූ අතර, 1996 වර්ෂයට අදාළ පැරණි වින්ඩෝස් මෘදුකාංග පද්ධතියක් මත ක්‍රියාත්මක වූ එය 2017 වර්ෂයේ සිට භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව ඇති බව ද නිරීක්ෂණය කරන ලදී.

- ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගුවන් යානා හතරකින් සමන්විත පද්ධති දෙකක් ඊශ්‍රායල සමාගමකින් මිලදී ගැනීමට සැලසුම් කර ඇති බවත්, දූපත් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාවට ගුවන් නිරීක්ෂණ හැකියාව අත්‍යවශ්‍ය බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

- නියමුවන් රහිත ගුවන් යානා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා පැයකට ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් 500ක පිරිවැයක් දැරීමට සිදුවන අතර, නියමුවන් සහිත නිරීක්ෂණ ගුවන් යානයක් ක්‍රියාත්මක කිරීම සඳහා පැයකට ඇමරිකානු ඩොලර් 6,000ක පමණ පිරිවැයක් දැරීමට සිදුවන බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී. තවද, සිරස් අතට ගුවන්ගත වීමේ සහ ගොඩබෑමේ (VTOL) හැකියාව පවතින බැවින් ධාවන පථයක අවශ්‍යතාවයක් නොමැති වීම මෙම පද්ධතියේ පිරිවැය ඵලදායීතාව ඉහළ නංවන බව ද නිරීක්ෂණය කරන ලදී. රාත්‍රී කාලයේ මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව සහ ගුවන් නිරීක්ෂණ හැකියාව ද මෙම පද්ධතිය සතු වන අතර, සමුද්‍රීය නිරීක්ෂණ සහ ආපදා ආශ්‍රිත මෙහෙයුම් ඇතුළු විවිධ කාර්යයන් සඳහා එය යොදාගත හැකි බව ද නිරීක්ෂණය කරන ලදී.

- රථවාහන පාලන කටයුතු සඳහා ද නියමුවන් රහිත ගුවන් යානා (ඩ්‍රෝන) භාවිත කරනු ලබන බව සභාපතිවරයා විසින් පෙන්වා දෙන ලදී.

- ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව සයිබර් ආරක්ෂණය සඳහා කැප වූ විශේෂිත හැකියාවක් පවතින බවත්, ඒ යටතේ ෆයර්වෝල් පද්ධති නඩත්තු කිරීම සහ ආරක්ෂිත සන්නිවේදන පද්ධති පවත්වාගෙන යාම සිදු කරන බවත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

- මෙම ප්‍රසම්පාදනය මුලින් 2027 වර්ෂයේදී සිදු කිරීමට රාජ්‍ය ආයෝජන වැඩසටහන (PIP) යටතේ සැලසුම් කර තිබූ ප්‍රසම්පාදනයක් කඩිනම් අවශ්‍යතාවය මත 2026 වර්ෂය දක්වා ඉදිරියට ගෙන ඒමක් බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී. රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ආපදා හෝ හදිසි අවස්ථාවකදී, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 42(5) වගන්තිය යටතේ එවැනි ප්‍රතිපාදන ඉදිරියට ගෙන ඒමට අවසර පවතින බව ද නිරීක්ෂණය කරන ලදී. දිට්වා සුළි කුණාටුව ආපදාවෙන් අනතුරුව ප්‍රකාශයට පත් කරන ලද හදිසි තත්ත්වය මෙම වගන්තිය ක්‍රියාත්මක කිරීමට පදනමක් සපයන බව ද නිරීක්ෂණය කරන ලදී. තවද, මෙම ප්‍රසම්පාදනය තරගකාරී ටෙන්ඩර් පටිපාටියකින් තොරව ඊශ්‍රායල සැපයුම්කරු විසින් ඉදිරිපත් කරන ලද අනාරාධිත යෝජනාවක් (Unsolicited Bid) මත සිදු කරනු ලබන අතර, හදිසි අවශ්‍යතාවය සහ ජාතික අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, එම ඉදිරිපත් කිරීම තරගකාරී පදනමක් මත ඇගයීමට ලක් කරන්නේ නම්, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ එවැනි ක්‍රියාමාර්ගයකට අවසර පවතින බව ද නිරීක්ෂණය කරන ලදී.

කාරක සභාවේ නිර්දේශ

- මෙවැනි ප්‍රතිපාදන නැවත වෙන් කිරීම් සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන සීමාවක් රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස තීරණය කළ යුතු බවත්, එම සීමාවට අඩු ප්‍රතිපාදන නැවත වෙන් කිරීම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම වෙනුවට, පාර්ලිමේන්තුවේ දැන ගැනීම සඳහා පමණක් ඉදිරිපත් කළ යුතු බවත් කාරක සභාව නිර්දේශ කරන ලදී.

- කොළඹ නගරයේ රථවාහන පාලන කටයුතු සඳහා නියමුවන් රහිත ගුවන් යානා (ඩ්‍රෝන) තාක්ෂණය යොදා ගැනීමට කටයුතු කළ යුතු බව කාරක සභාව නිර්දේශ කරන ලදී.

කාරක සභාවේ තීරණය

කරුණු සලකා බැලීමෙන් පසුව,

- **2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා 2025 අංක 23 දරන විසර්ජන පනතේ ශීර්ෂය 224 - වැඩසටහන 01 යටතේ පරිපූරක මුදල**

සම්බන්ධයෙන් කාරක සභාව එකඟතාවය පළ කළ අතර, ඒ පිළිබඳ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව, 2026 නොවැම්බර් මස 05 වැනි දින කාරක සභාවේ සභාපති ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බවට තීරණය කළා ය.

குழுவின் அறிக்கை

அரசாங்க நிதி பற்றிய குழு 2026 நவம்பர் மாதம் 05 ஆம் திகதி நடத்திய கூட்டத்தின் போது பின்வரும் குறைநிரப்புத் தொகை தொடர்பில் ஆராயப்பட்டது.

- **2026 சனவரி 01 ஆம் திகதியில் தொடங்கி 2026 திசெம்பர் 31 ஆம் திகதியில் நிறைவடைகின்ற நிதியாண்டின் பயன்பாட்டிற்காக, 2025 ஆம் ஆண்டின் 23 ஆம் இலக்க ஒதுக்கீட்டுச் சட்டத்தின் செலவினத் தலைப்பு 224 - நிகழ்ச்சித்திட்டம் 01 ன் கீழான குறைநிரப்புத் தொகை**
  (2026 நவம்பர் மாதம் 03 ஆம் திகதி பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டு குழுவிற்கு ஆற்றுப்படுத்தப்பட்டது)

குழுவினால் ஆராயப்பட்ட திகதி : 2026 நவம்பர் மாதம் 05 **நேரம்** : மு.ப. 08.00

கலந்துகொண்ட அரசாங்க நிதி பற்றிய குழுவின் அங்கத்துவ உறுப்பினர்கள்

1. கௌரவ (கலாநிதி) ஹர்ஷ த சில்வா, பா.உ., (தவிசாளர்)
2. கௌரவ சதுரங்க அபேசிங்ஹ, பா.உ.,
3. கௌரவ ரவி கருணாநாயக்க, பா.உ.,
4. கௌரவ அஜித் அகலகட, பா.உ.,
5. கௌரவ நிமல் பலிஹேன, பா.உ.,
6. கௌரவ விஜேசிரி பஸ்நாயக்க, பா.உ.,
7. கௌரவ சுனில் றாஜபக்ஷ, பா.உ.,
8. கௌரவ திலிண சமரகோன், பா.உ.,
9. கௌரவ (செல்வி) சட்டத்தரணி லக்மாலி ஹேமசந்திர, பா.உ.,

- **2026 சனவரி 01 ஆம் திகதியில் தொடங்கி 2026 திசெம்பர் 31 ஆம் திகதியில் நிறைவடைகின்ற நிதியாண்டின் பயன்பாட்டிற்காக, 2025 ஆம் ஆண்டின் 23 ஆம் இலக்க ஒதுக்கீட்டுச் சட்டத்தின் செலவினத் தலைப்புகள் 224 - நிகழ்ச்சித்திட்டம் 01 ன் கீழான குறைநிரப்புத் தொகை**

அறிமுகம்

மாறிவரும் செயற்பாட்டுச் சூழல், வங்காள விரிகுடா மற்றும் அதனைச் சூழவுள்ள பகுதிகளில் ஏற்படக்கூடிய அனர்த்தங்களுக்கு வழிவகுக்கும் தொடர்ச்சியான பாதகமான காலநிலை நிலைமைகளினால் உருவாகும் உடனடி அச்சுறுத்தல்கள் ஆகியவற்றைக் கருத்திற்கொண்டு, இலங்கை விமானப்படைக்காக ஆளில்லா வானூர்தி முறைமையொன்றை நிறுவுவதற்குத் தீர்மானிக்கப்பட்டுள்ளது, மேலும், வழங்கப்பட்டுள்ள சாதகமான வர்த்தக நிபந்தனைகளைக் கருத்திற்கொண்டு, அதனை நேரடி ஒப்பந்தத்தின் மூலம் இஸ்ரேல் அரசுக்குச் சொந்தமான இஸ்ரேல் ஏரோஸ்பேஸ் இன்டஸ்ட்ரீஸ் (Israel Aerospace Industries IAI) நிறுவனத்திடமிருந்து கொள்வனவு செய்வதற்கும், இதற்காக, ஆரம்பச் செலவு வரம்பில் பாதிப்பு ஏற்படாத வகையில், இலங்கை விமானப்படையின் 224-1-01-2002 செலவினத்தின் கீழ் ரூபா. 7,000 மில்லியன் நிதி ஒதுக்கீட்டைத் தடுத்து வைத்து, 224-1-01-2101 செலவினத்தின் தலைப்புக்கு ரூபா. 4,261 மில்லியன் நிதி ஒதுக்கீட்டை குறைநிரப்பு மதிப்பீட்டின் மூலம் இலங்கை விமானப்படையின் செயற்பாட்டு நிகழ்ச்சித்திட்டத்தின் கீழ், பொது நிர்வாகம் மற்றும் நிறுவனச் சேவைகள் கருத்திட்டத்தின் ஊடாகப் பெற்றுக்கொள்ளும் வகையில் பாராளுமன்றத்தில் முன்மொழிவை சமர்ப்பித்து, அதற்கான அனுமதிணை பெற்றுக்கொள்வதற்கும் அமைச்சரவை ஒப்புதல் வழங்கியுள்ளது.

அதன்படி, பாராளுமன்றத்திடமிருந்து மேற்குறிப்பிட்ட அனுமதியை பெற்றுக்கொள்வதே இவ் முன்மொழிவின் எதிர்பார்ப்பு.

குழுவின் அவதானிப்புக்கள்

- நிதி ஒழுங்குவிதி 66 ஆனது, சம்பந்தப்பட்ட இரண்டு வாக்குகளுக்கு (votes) இடையில், புனரமைப்புக்கான மூலதனச் செலவினத்திலிருந்து (refurbishment capital expenses) கொள்வனவுக்கான மூலதனச் செலவினத்திற்கு (acquisition capital expenses) நிதியை மீளொதுக்கீடு செய்வதற்கு அனுமதிக்காத காரணத்தினால், பாராளுமன்றத்தின் அங்கீகாரம் கோரப்படுவதாகக் குழு அவதானித்தது.

- இத்தகைய ஒப்பீட்டளவில் சிறிய அளவிலான நிதி மீளொதுக்கீடுகளுக்கு அங்கீகாரம் பெறுவதற்காக அமைச்சு பாராளுமன்றத்திற்கு வருவது அவசியமா என தவிசாளர் கேள்வி எழுப்பினார்.

- பாராளுமன்றத்தின் அங்கீகாரமின்றி, தமது சொந்த வரவு-செலவுத் திட்டத்தின் செலவினப் பிரிவுகளுக்கு இடையில், மீண்டுவரும் (செயற்பாட்டு) செலவினத்தையும், மூலதனச் செலவினத்தையும் குறிப்பிட்ட வரம்பு வரை மாற்றுவதற்கு அமைச்சுக்களுக்கு அனுமதி வழங்கப்பட வேண்டும் எனக் குழு பரிந்துரைத்தது. இதற்குத் தத்தமது பிரதம கணக்கீட்டு அலுவலரின் அங்கீகாரமும் நிதி அமைச்சின் ஒப்புதலும் பெறப்பட வேண்டும்.

- இலங்கை விமானப்படையானது 1996ஆம் ஆண்டு முதல் ஆளில்லா வானூர்தித் திறனைக் (unmanned aerial capability) கொண்டிருந்ததாகக் குழு அவதானித்தது. வானூர்திகள் இரண்டு கொண்டிருந்த தற்போதைய முறைமை, 1996ஆம் ஆண்டைச் சேர்ந்த Windows மென்பொருளில் இயங்கியதுடன், 2017ஆம் ஆண்டு முதல் பயன்பாட்டிற்கு உகந்ததாக இல்லாமல் இருந்தது.

- இஸ்ரேலிய நிறுவனம் ஒன்றிடமிருந்து நான்கு வானூர்திகளைக் கொண்ட இரண்டு முறைமைகளைக் கொள்வனவு செய்ய இலங்கை விமானப்படை திட்டமிட்டுள்ளதாகவும், ஒரு தீவு நாடு என்ற வகையில் இலங்கைக்கு வான்வழிக் கண்காணிப்பு (aerial surveillance) அவசியமாக உள்ளதாகவும் குழு அவதானித்தது.

- ஆளில்லா வானூர்தி முறைமையின் செயற்பாட்டுச் செலவு ஒரு மணித்தியாலத்திற்கு சுமார் 500 அமெரிக்க டொலர்களாகக் காணப்படுகின்றது. இதனுடன் ஒப்பிடுகையில், ஆளுடன் இயக்கப்படும் கண்காணிப்பு விமானத்தின் செயற்பாட்டுச் செலவு ஒரு மணித்தியாலத்திற்கு சுமார் 6,000 அமெரிக்க டொலர்களாகும். மேலும், செங்குத்தாகப் புறப்பட்டு தரையிறங்கும் திறன் (Vertical Take-Off and Landing) காரணமாக, முன்மொழியப்பட்ட முறைமைக்குப் புறப்பாடு மற்றும் தரையிறக்க ஓடுபாதை தேவையில்லை என்பதால், இது செலவுத் திறன்மிக்கதாக (cost-effective) அமைகின்றது என்றும் குழு அவதானித்தது. முன்மொழியப்பட்ட முறைமை இரவு நேரச் செயற்பாட்டுத் திறனையும் வான்வழிக் கண்காணிப்புத் திறனையும் கொண்டுள்ளது. கடல்சார் கண்காணிப்பு, அனர்த்தம் தொடர்பான நடவடிக்கைகள் உள்ளிட்ட பல்வேறு தேவைகளுக்காக இதனைப் பயன்படுத்த முடியும் என்றும் குழு அவதானித்தது.

- போக்குவரத்துக் கட்டுப்பாட்டிற்காகவும் ஆளில்லா வானூர்திகள் (UAVs) பயன்படுத்தப்படுவதாக தவிசாளர் குறிப்பிட்டார்.

- இலங்கை விமானப்படையானது, தீச்சுவர்கள் (firewalls) மற்றும் பாதுகாப்பான தொடர்பாடல் முறைமைகளைப் (secure communications) பராமரிப்பதற்கெனத் தனியான இணையப் பாதுகாப்புத் திறனை கொண்டுள்ளதாகக் குழு அவதானித்தது.

- இந்தக் கொள்வனவானது, பொதுமுதலீட்டுத் திட்டத்தின் கீழ் ஆரம்பத்தில் 2027ஆம் ஆண்டிற்குத் திட்டமிடப்பட்டிருந்த கொள்வனவின் மேம்படுத்தப்பட்ட வடிவமாக முன்னெடுக்கப்படுவதாகவும், உடனடித் தேவையைக் கருத்திற்கொண்டு அது 2026ஆம் ஆண்டிற்கு முன்கொண்டுவரப்படுவதாகவும் குழு அவதானித்தது. அரசாங்கத்தினால் பிரகடனப்படுத்தப்பட்ட அனர்த்தம் அல்லது அவசரகால நிலைமையின் போது, இவ்வாறு கொள்வனவுகளை முன்கொண்டுவருவதற்கு அரச நிதி முகாமைத்துவச் சட்டத்தின் (PFM Act) 42(5)ஆம் பிரிவு அனுமதிக்கின்றது. டித்வா சூறாவளியைத் (Cyclone Ditwah) தொடர்ந்து பிரகடனப்படுத்தப்பட்ட அவசரகால நிலைமை, இப்பிரிவைப் பயன்படுத்துவதற்கு

வழிவகுக்கின்றது. மேலும், இந்தக் கொள்வனவானது போட்டித்தன்மை வாய்ந்த கேள்விப்பத்திர நடைமுறையின்றி, இஸ்ரேலிய விநியோகஸ்தரிடமிருந்து கிடைக்கப்பெற்ற கோரப்படாத முன்மொழிவின் (unsolicited bid) அடிப்படையில் மேற்கொள்ளப்படுகின்றது. எனினும், தேசிய நலனைக் கருத்திற்கொண்ட அவசரத் தேவை நிலவுகின்ற சந்தர்ப்பத்தில், குறித்த முன்மொழிவு போட்டித்தன்மை அடிப்படையில் மதிப்பீடு செய்யப்பட வேண்டும் என்ற நிபந்தனையின் கீழ், கொள்வனவு வழிகாட்டல்களின்படி (procurement guidelines) இத்தகைய கொள்வனவிற்கு அனுமதி வழங்கப்படுகின்றது.

குழுவின் விதப்புரைகள்

- இத்தகைய நிதி மீளொதுக்கீடுகளுக்கு பாராளுமன்றத்தின் அங்கீகாரம் தேவையில்லாத, அதற்குக் கீழான வரம்புத் தொகையை (threshold) அரசாங்கம் கொள்கை ரீதியாகத் தீர்மானிக்க வேண்டும் என்றும், அவ்வாறான மீளொதுக்கீடுகள் அங்கீகாரத்திற்காகச் சமர்ப்பிக்கப்படுவதற்குப் பதிலாக, தகவலுக்காகப் பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட வேண்டும் என்றும் குழு பரிந்துரைத்தது.
- கொழும்பில் போக்குவரத்துக் கட்டுப்பாட்டிற்காக (traffic control) ஆளில்லா வானூர்தித் திறனைப் (drone capacity) பயன்படுத்த வேண்டும் எனக் குழு பரிந்துரைத்தது.

குழுவின் தீர்மானம்

பரிசீலனை செய்த பிறகு,

- **2026 சனவரி 01 ஆம் திகதியில் தொடங்கி 2026 திசெம்பர் 31 ஆம் திகதியில் நிறைவடைகின்ற நிதியாண்டின் பயன்பாட்டிற்காக, 2025 ஆம் ஆண்டின் 23 ஆம் இலக்க ஒதுக்கீட்டுச் சட்டத்தின் செலவினத் தலைப்பு 224 - நிகழ்ச்சித்திட்டம் 01 ன் கீழான குறைநிரப்புத் தொகை**

உடன் குழு உடன்பட்டு அதனை அங்கீகரித்தது.

அதன்படி, அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கையை அரசாங்க நிதி பற்றிய குழுவின் தவிசாளர் கௌரவ (கலாநிதி) ஹர்ஷ த சில்வா அவர்களினால் 2026 நவம்பர் மாதம் 05 ஆந் திகதி பாராளுமன்றத்தில் சமர்ப்பிக்க முடிவு செய்யப்பட்டது.

Report of the Committee

The Committee on Public Finance at its meeting held on 05th November 2026 considered the following Supplementary Sum;

- **Supplementary Sum under Head 224 of Programme 01 of the Appropriation Act No. 23 of 2025 for the services of the financial year commencing on 01st January, 2026, and ending on 31st December, 2026**

  (Presented to Parliament on 03rd November 2026 and referred to the Committee)

Date Considered by the Committee: 05th November 2026 **Time: 08.00 a.m.**

Members of the Committee on Public Finance Present

1. Hon. (Dr.) Harsha de Silva, M.P., (Chair)
2. Hon. Chathuranga Abeysinghe, M.P.,
3. Hon. Ravi Karunanayake, M.P.,
4. Hon. Ajith Agalakada, M.P.,
5. Hon. Nimal Palihena, M.P.,
6. Hon. Wijesiri Basnayake, M.P.,
7. Hon. Sunil Rajapaksha, M.P.,
8. Hon. Thilina Samarakoon, M.P.,
9. Hon. (Ms.) Lakmali Hemachandra, Attorney at Law, M.P.,

- **Supplementary Sum under Head 224 of Programme 01 of the Appropriation Act No. 23 of 2025 for the services of the financial year commencing on 01st January, 2026, and ending on 31st December, 2026**

Introduction

Taking into consideration the evolving operational environment and the imminent threats arising from the frequently adverse weather conditions which render the Bay of Bengal and its surrounding regions susceptible to disasters, it has been decided that the Sri Lanka Air Force shall establish an Unmanned Aerial Vehicle (UAV) system. Furthermore, in light of the favorable commercial terms offered, this system is to be procured through a direct contract from Israel Aerospace Industries (IAI), a company owned by the Government of Israel. The Cabinet granted approval to submit a proposal to Parliament to obtain authorization via a supplementary estimate to reallocate an allocation of Rs. 7,000 million from the Sri Lanka Air Force's vote particular 224-1-01-2002, and to provide an allocation of Rs. 4,261 million under vote particular 224-1-01-2101. This reallocation is to be effected under the 'General Administration and Institutional Services' project within the 'Operations' programme of the Sri Lanka Air Force, in a manner that does not impact the primary expenditure limit.

Accordingly, this proposal seeks to obtain the aforementioned approval from Parliament.

Observations of the Committee

- The Committee observed that the approval of Parliament is sought because Financial Regulation 66 does not permit the reallocation of funds between the two votes concerned, from refurbishment capital expenses to acquisition capital expenses.
- The Chair questioned whether it was necessary for the Ministry to come before Parliament for approval of relatively small reallocations of this nature.
- The Committee suggested that ministries be permitted to move recurrent (operational) and capital expenditure between the expenditure lines of their own budget, up to a certain limit, with the authorization of their own Chief Accounting Officer and MoF approval, without Parliamentary approval.

- The Committee observed that the Sri Lanka Air Force has had an unmanned aerial capability since 1996. The existing system, which had two air vehicles and runs on 1996-era Windows software, has been unserviceable since 2017.
- The Committee observed that the Sri Lanka Air Force plans to purchase two systems with four air vehicles from and Israeli Company, and that as an island nation Sri Lanka requires aerial surveillance.
- The Committee observed that the operating cost of the unmanned system is about USD 500 per hour, compared with about USD 6,000 per hour for a manned-surveillance aircraft, and that the proposed system does not need a runway due to VTOL capability, which makes it cost-effective. The Committee observed that the proposed system provides night capability and aerial surveillance. It serves many purposes, including maritime surveillance, disaster related operations.
- The Chair noted that UAVs are used for traffic control.
- The Committee observed that the Sri Lanka Air Force has dedicated cyber security capacity who maintain firewalls and secure communications.
- The Committee Observed that this procurement is being done as an advancement of a procurement that was initially planned for 2027 under the PIP but is being brought forward to 2026 due to the immediate need. Such as bringing forward is permitted under Section 42(5) of the PFM Act in the case of a disaster or emergency situation declared by the government. The emergency declared following Cyclone Ditwah allows for utilization of this clause. The procurement is also done without a competitive tender and is based on an unsolicited bid from the Israeli supplier, which is allows under procurement guidelines, provided that the offer is assessed on a competitive basis given the emergency need in the national interest.

Recommendations of the Committee

- The Committee recommended that the Government decide, as a matter of policy, a threshold below which reallocations of this kind would not require the approval of Parliament but would instead be tabled in Parliament for information.
- The Committee recommended using drone capacity for traffic control in Colombo.

Decision of the Committee

After consideration, the Committee agreed to;

- **Supplementary Sum under Head 224 of Programme 01 of the Appropriation Act No. 23 of 2025 for the services of the financial year commencing on 01st January, 2026, and ending on 31st December, 2026**

and accordingly decided that the Report of the Committee on Public Finance thereon be presented to Parliament by the Hon. (Dr.) Harsha de Silva, the Chair of the Committee on Public Finance, on 05th November 2026.

Annexure I

Officials Present

Ministry of Finance

Mr. S.S. Mudalige - Deputy Secretary to the Treasury

Department of National Budget

Mrs. P.L.D.P. Senarathna - Director

Mr. S.C. Senarathna – Director

Department of Project Management and Monitoring

Mr. M.E. Mubarak - Additional Director General

Department of National Planning

Mrs. Asha Weerasinghe - Director

Ministry of Defence

Mr.E.A.J.Edirisinghe - Additional Secretary (Defence)

Mr. L.D.N.Kumarasiri - Chief Financial Officer

Sri Lanka Air Force

Mr. L.H. Sumanaweera – Chief of Staff

H.A.V.Dias - Air Commondore

P.S. Kodikara - Wing Commander

K.K.U.L.Wanigaarachchi - Squadron Leader

G.T. Jayasinghe - Squadron Leader